7G.C.E. ORDINARY LEVEL

අ.පො.ස. සාමාන්‍ය පෙළ

STUDENT SEMINAR SERIES - 2019

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2019

# INFORMATION & COMMUNICATION TECHNOLOGY

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## QUESTION PAPER – I, II

## ප්‍රශ්න පත්‍රය -I,II

## (සිංහල මාධ්‍යය)



අනුග්‍රහය

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

The National e-learning Portal for The General Education

අධ්‍යාපන අමාත්‍යාංශය
ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය
අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2019

80 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ 1 |
|---|---|---|

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් නිවැරදි /වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. ආචයනය කරන ලද ක්‍රමලේඛන සංකල්පය (Stored program concept) හඳුන්වා දෙන ලද්දේ,
(1). පළමු පරම්පරාවේ පරිගණක සමග
(2). දෙවන පරම්පරාවේ පරිගණක සමග
(3). තෙවන පරම්පරාවේ පරිගණක සමග
(4). හතරවන පරම්පරාවේ පරිගණක සමග

02. පහත ප්‍රකාශ සලකා බලන්න.

A – අරුණ සියලුම විෂයයන් සඳහා දක්ෂතා පෙන්වා ඇත.
B – අරුණ ගණිතය විෂයය සඳහා ලකුණු 95ක් ලබා ඇත.
ඉහත ප්‍රකාශ ඇසුරෙන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1). A – ගුණාත්මක දත්ත B – ප්‍රමාණාත්මක දත්ත
(2). A – ප්‍රමාණාත්මක දත්තB – ගුණාත්මක දත්ත
(3). A – ප්‍රමාණාත්මක දත්තB – ප්‍රමාණාත්මක දත්ත
(4). A – ගුණාත්මක දත්ත B – ගුණාත්මක දත්ත

03. “ජංගම දුරකථනයක් භාවිතයෙන් QR කේතයක් කියවා අන්තර්ජාලයට පිවිසිය හැකිය. අදාළ වෙබ් අඩවියෙන් දත්ත ලබාගෙන ජංගම දුරකථනය හරහා අදාල තොරතුරු පෙන්විය හැකිය.” ඉහත සිද්ධියට අදාලව **ආදාන, සැකසුම්** හා **ප්‍රතිදාන** සඳහා ගැලපෙන උදාහරණ පිළිවෙලින් පෙන්වන පිළිතුර තොරන්න.
(1). QR කේතය, අන්තර්ජාලයට සම්බන්ධවීම, තොරතුරු ලබා දීම
(2). තොරතුරු, තොරතුරු ලබා දීම, තොරතුරු
(3). QR කේතය, වෙබ් අඩවියෙන් තොරතුරු ලබා දීම, තොරතුරු
(4). තොරතුරු, අන්තර්ජාලයට සම්බන්ධවීම, QR කේතය

04. පහත ඒවායින් කුමක් දුරස්ථ සෞඛ්‍ය රැකවරණයේ ලක්ෂණයක් නොවන්නේද?
(1). රෝගීන් අධීක්ෂණය
(2). දුරස්ථ සායනික උපදෙස් ඉක්මන් බව
(3). හදිසි රෝගී තත්තවයන් සඳහා ඕනෑම වේලාවක සම්බන්ධ කර ගැනීම පහසු වීම
(4). දුරස්ථ පුහුණුවීම්වලදී අඩු පිරිවැය

05. පහත වගුවේ විවිධ වර්ගයේ පරිගණක හා ඒවායේ ලක්ෂණ / භාවිතයන් ඇත. නිවැරදි සංයෝග දැක්වෙන වරණය තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| A | මහා පරිමාණයේ ව්‍යාපාර සඳහා මෙන්ම ආරක්ෂිත කටයුතු සඳහා භාවිත වේ. | 1 | මහා පරිගණක |
| B | පරිගණක උපාංග කිහිපයක් හරහා පරිශීලකයන් කිහිප දෙනෙකුට සම්බන්ධ කර ක්‍රියා කළ හැක. | 2 | මධ්‍ය පරිගණක |
| C | අඩු විදුලි භාවිතයක් ඇත. | 3 | සුපිරි පරිගණක |
| D | විශාල ප්‍රමාණයේ ව්‍යාපාර සඳහා අවශ්‍ය වේ. | 4 | ක්ෂුද්‍ර පරිගණක |

(1). A – 2 ,B – 4, C – 3 , D– 1
(2). A – 3 ,B – 4, C – 3 , D– 2
(3). A – 4 ,B – 3, C – 4 , D– 2
(4). A – 3 ,B – 2, C – 4 , D– 1

06. පහතින් දැක්වෙන්නේ මුද්‍රණ අවශ්‍යතා 2කි.
A - ATM යන්ත්‍රයක බිල්පත් මුද්‍රණය සඳහා
B - පැහැදිලි ගුණාත්මක රූප සහිතව මුද්‍රණය සඳහා
ඉහත අවශ්‍යතා සපුරා ගැනීම සඳහා භාවිත කළ හැකි වඩාත් සුදුසු මුද්‍රණ යන්ත්‍ර වර්ග 2 සහිත නිවැරදි පිළිතුර වන්නේ,
(1). තාප මුද්‍රකය හා ලේසර් මුද්‍රකය
(2). තීන්ත විදුම් මුද්‍රක යන්ත්‍රය හා ලේසර් මුද්‍රකය
(3). තාප මුද්‍රකය හා පේළි මුද්‍රකය
(4). තීන්ත විදුම් මුද්‍රක යන්ත්‍රය හා තාප මුද්‍රකය

07. පරිගනකයක සිංහල / දෙමළ භාෂාවක යෙදුම් ඇතුලත්ව ඇතිවිට එය නිරූපනයේදී වඩාත් සුදුසු කේත ක්‍රමය වන්නේ,
(1). BCD
(2). ASCII
(3). EBCDIC
(4). UNICODE

08. පරිගණකය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ඇතුලත් කර ඇති මතකය වන්නේ,
(1). මතක රෙජිස්තර
(2). සසම්භාවී ප්‍රෙවිශ මතකය
(3). වාරක මතකය
(4). පඨන මාත්‍ර මතකය

09. එක්තරා ප්‍රවේශ විභාගයකින් සමත්වීම සඳහා සමත්විය යුතු විෂය කාණ්ඩ පහතින් දැක්වේ.
විෂය කාණ්ඩය A - විෂයය 1 හා විෂයය 2
විෂය කාණ්ඩය B - විෂයය 3 හා විෂයය 4
විෂය කාණ්ඩය C - විෂයය 5 හා විෂයය 6
විෂය කාණ්ඩය D - විෂයය 7 හා විෂයය 8
තොරතුරු තාක්ෂණ පාඨමාලාවට සුදුසුකම් ලැබීම සඳහා A හා B කාණ්ඩ දෙකෙන්ම එක් විෂයය බැගින් ද C හා D කාණ්ඩ දෙකෙන් ඕනෑම එකකින් එක් විෂයයක් පමණක් සමත්වී තිබිය යුතුය. ඒ අනුව එම ප්‍රකාශය වඩාත් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1). A and B and (C or D)
(2). (A or B) and C and D
(3). (A or B ) and (C or D)
(4). (A and B) or (C and D)

10. $35_8$ ට සමාන ද්වීමය අගය වන්නේ,
(1). $00011101_2$
(2). $00111011_2$
(3). $00111010_2$
(4). $01010101_2$

11. පහත වගුවේ ආචයන උපාංග කිහිපයක් සහ ඒවායේ භාවිත/ ලක්ෂණ දැක්වේ. මෙම වගුවට අනුව නිවැරදි සංයෝග සහිත වරණය තෝරන්න.

| a | | b | |
|---|---|---|---|
| A | මතක කාඩ්පත් | 1 | පහසුවෙන් දත්ත එහා මෙහා ගෙන හා හැකි වීම හා වේගවත්ව දත්ත හැසිරවීමේ හැකියාව |
| B | Blue - ray 3D | 2 | ඩිජිටල් කැමරා, ජංගම දුරකථන හා පරිගණක ක්‍රීඩා උපාංග ආදියෙහි භාවිතය |
| C | USB ෆ්ලෑෂ් ධාවක | 3 | වීඩියෝ පටිගත කිරීම සඳහා |

(1). A – 1 ,B – 2, C - 3
(2). A – 3 ,B – 2, C - 1
(3). A – 2 ,B – 3, C - 1
(4). A – 3 ,B – 1, C - 2

12. සේවාදායක පරිගණක එක් උපාංගයක් පමණ සම්බන්ධ කරමින් එම උපාංගය මගින් ස්ථානීය පෙදෙස් ජාලය සම්බන්ධ කරවීමක් සිදු කෙරෙන ස්ථලකය වනුයේ,
(1). තරු
(2). මුදු
(3). බස්
(4). දැල්


13. පරිගණක 10කින් යුතු ස්ථානීය පෙදෙස් ජාලයක් ස්ථාපනය කිරීමේදී අවශ්‍යතා වශයෙන් පහත දෑ සඳහන්ව ඇත.

A - සියලුම පරිගණකයන් හා අනෙකුත් උපාංග සඳහා අන්තර්ජාල පහසුකම ලබා දීම
B - අන්තර්ජාලය සමග සම්බන්ධ වීමේදී ජාලය තුළ දත්ත සඳහා ආරක්ෂාව සහිතවීම
C - වඩාත් කාර්යක්ෂම සන්නිවේදනයක් සහිතව පරිගණක හා අනෙකුත් උපාංග එකිනෙකට සම්බන්ධ කිරීම

ඉහත අවශ්‍යතා සපුරාලීම සඳහා වඩාත් උචිත උපාංග ඇතුලත් වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1). | A – මාර්ගකාරකය | B – ප්‍රති වෛරස් මෘදුකාංග | C - නාභිය |
| (2). | A – මාර්ගකාරකය | B – ගිණි පවුර | C - නාභිය |
| (3). | A – මාර්ගකාරකය | B – ගිණි පවුර | C - ස්විචය |
| (4). | A – ගිණි පවුර | B – මාර්ගකාරකය | C - ස්විචය |


14. පහත දැක්වෙන දසුන් තීරු අතුරෙන් තෝරා ගත් කදාවක් පූර්ණ තිරයේ දැක්වෙන අයුරින්ම දැක ගැනීමට හැකි දසුන් තීරුව වන්නේ,
(1). A
(2). B
(3). C
(4). D




15. පහත අගයන් අතුරින් විශාලතම අගය වන්නේ,

(1). $125_{10}$
(2). $AC_{16}$
(3). $0010\ 0111_{bcd}$
(4). $553_8$

16. පහත පරිපථයේ අවසාන ප්‍රතිදානය 0 වීමට එහි ආදාන සංයෝග තිබිය යුතු ආකාරය නිවැරදිව දැක්වෙන්නේ,




(1). x = 0 y = 0
(2). x = 0 y = 1
(3). x = 1 y = 0
(4). x = 1 y = 1

17. ධාරිතාව 128 MB, 512MB සහ 1 GB වන ගොනු 3ක් ගබඩා කිරීමට සිසක්ට අවශ්‍යව ඇති අතර එම ගොනු ගබඩා කිරීම සඳහා 2GB ධාරිතව සහිත USB ෆ්ලෑෂ් ධාවකයක් ඇත. මෙම ගොනු ගබඩා කිරීමෙන් අනතුරුව තවත් ඉතිරිව ඇති ධාරිතාව කොපමණද?

(1). 380KB
(2). 384MB
(3). 384GB
(4). ඉඩක් ඉතිරි නැත.

18. දෙන ලද ආදාන සංයෝග යටතේ පහත ඒවායින් කුමන පරිපථ සමාන ප්‍රතිදාන ලබා දෙයිද?




A B C

(1). A සහ B
(2). A සහ C
(3). B සහ C
(4). A, B සහ C


19. ආදානය ලෙස 4,6,12, 15,14,13,20,9 ඇතුලත් කල විට,

මෙම ගැලීම් සටහන කී වතාවක් ක්‍රියාත්මක වන්නේ ද?




(1). 4 වරක්
(2). 3 වරක්
(3). 5 වරක්
(4). 8 වරක්

20. පහතින් දැක්වෙන්නේ මෙහෙයුම් පද්ධතිය ආශ්‍රිත රූප සටහනකි.



මෙහි A සහ B සඳහා සුදුසු යෙදුම් පිළිවෙලින් දැක්වෙන්නේ,

(1). යෙදුම් මෘදුකාංග හා දෘඩාංග
(2). පද්ධති මෘදුකාංග හා දෘඩාංග
(3). යෙදුම් මෘදුකාංග හා පරිශීලක
(4). යෙදුම් මෘදුකාංග හා උපයෝගීතා මෘදුකාංග

21. පරිගණක ක්‍රමලේඛ ඇසුරෙන් පහත දී ඇති වගන්ති අතුරෙන් වැරදි වගන්තිය තෝරන්න

(1). වස්තු නැඹුරු පරිගණක ක්‍රමලේඛ භාවිතයේදී වස්තු යන සංකල්පය භාවිත වේ.
(2). අර්ථ වින්‍යාසක භාවිතයේදී ක්‍රමලේඛයේ කාරක රීතිදෝෂ නොමැතිනම් ධාවනයෙන් පසු නිවැරදි ප්‍රතිදානය ලබා දේ.
(3). ක්‍රමලේඛ ක්‍රියාවලියට ප්‍රවේශ වීම පිණිස පවතින විකල්ප ප්‍රවේශ ක්‍රමලේඛන පැරඩයිම ලෙස හඳුන්වයි.
(4). ප්‍රධාන වැඩසටහනට ප්‍රතිදානයක් ආපසු ලබා නොදෙන උප ක්‍රමලේඛ කාර්ය පටිපාටි නම්වේ.

22. පැතුරුම්පත් මෘදුකාංගයකදී 5mod2*30/5-(2**2) හි නිවැරදි පිළිතුර වන්නේ,

(1). 30
(2). 2
(3). 12
(4). 16

පහත දී ඇති පැතුරුම්පත ඇසුරෙන් 23 හා 24 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

| | A | B | C | D | E | F | G | H | I |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | x | 3 | 2 | 1 | 0 | -1 | -2 | z | 5 |
| 2 | $y = (x+2)^2$ | 25 | 16 | 9 | 4 | 1 | 0 | | |
| 3 | a = x*2 | 6 | 4 | 2 | 0 | -2 | -4 | | |
| 4 | $x^2$ | 9 | 4 | 1 | 0 | 1 | 4 | | |
| 5 | f=(x+y)z | 140 | 90 | 50 | 20 | 0 | -10 | | |

23. A4 කෝෂයේ ඇති ආකාරයට එම අගය B2 කෝෂයේ සිට G2 කෝෂය දක්වා සෙවීම අවශ්‍යව ඇත. ඒ අනුව B2 කෝෂයේ ඇතුලත් විය යුතු ශ්‍රිතය වන්නේ

(1). =(B1+2)^2
(2). B2= (B1+2)^2
(3). =($B1+2)*2
(4). =B1+2^2

24. ඉහත පැතුරුම්පතෙහි B5 කෝෂය තුළ ඇතුලත් විය නොහැකි ශ්‍රිතයක් වන්නේ,

(1). =(B1+B2)*$I1
(2). =(B1+B2)*I$1
(3). =(B1+B2)*$I$1
(4). =(B1+((B1+2)^2))*$I1

25. විද්‍යුත් සමර්පණයක් ඉදිරිපත් කිරීමේදී පහත කාර්යයන් ඉටු කිර ගැනීමට භාවිත කළ හැකි කෙටිමං යතුරු පිළිවෙලින් නිවැරදිව දැක්වෙන්නේ,

A – තිරය කලු පැහැයෙන් පෙන්වීමට
B – සමර්පණයෙන් ඉවත්වීමට

(1). Ctrl + B සහ N
(2). B සහ Ctrl + N
(3). B සහ Esc
(4). Ctrl + B සහ Ctrl + N

26. පැතුරුම්පතක සිටින ස්ථානයේ සිට A තීරුව වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කෙටිමංයතුර වන්නේ,

(1). Home
(2). CTRL + arrow keys
(3). CTRL + up arrow
(4). CTRL + HOME

ප්‍රශ්ණ අංක 27 හා 28 සඳහා පිළිතුරු සැපයීමට පහත දත්ත පාදක කොටස භාවිත කරන්න.

**Item**

| itemNo | Item name | Price | Qty |
|---|---|---|---|
| i0543 | Buscuit | 45.00 | 450 |
| i0545 | Butter | 230.00 | 200 |
| i0547 | Jam | 145.00 | 250 |
| i0549 | Milk powder | 345.00 | 150 |

**Item_bill**

| Bill_No | ItemNo | Qty |
|---|---|---|
| b0234 | i0543 | 10 |
| b0342 | i0547 | 30 |
| b0342 | i0545 | 40 |
| b0453 | i0547 | 20 |
| b0458 | i0543 | 30 |

**Bill**

| Bill_No | Amount |
|---|---|
| b0234 | 2500.00 |
| b0342 | 240.00 |
| b0453 | 3200.00 |
| b0458 | 3400.00 |

27. ඉහත දත්ත පාදකයට අනුව Item වගුව හා Bill වගුව අතර සම්බන්ධතාවය කුමක්ද

(1). ඒක - බහු
(2). බහු - බහු
(3). බහු - ඒක
(4). ඒක - ඒක

28. මෙහි විකුණුම් පිළිබඳ සියලුම තොරතුරු වගු කිහිපයක ගබඩා කිරීම වෙනුවට එක් වගුවක තබා ගත හැකිය. නමුත් එවිට ඔබ මුහුණ දිය හැකි ගැටළු ඇතුලත් වරණය තෝරන්න.

(1). දත්ත ඇතුලත් කිරීමේ පහසුව, දත්ත අනුපිටපත් වීම, මතකය අවභාවිතය
(2). දත්ත අනුපිටපත් වීම, දත්ත සමරික්තතාවය, දත්ත යාවත්කාලීන කිරීමේ පහසුව
(3). දත්ත අනුපිටපත් වීම, දත්ත සමරික්තතාවය, දත්ත හැසිරවීමේ අපහසුව
(4). දත්ත සමරික්තතාවය, දත්ත අනුපිටපත් වීම, දත්ත සැකසීමේ කාර්යක්ෂමබව

29. පහත ව්‍යාජ කේතය සලකන්න.

```
Input marks
sum=0
x=0
while(mark>=74) do
        sum=sum+marks
        x=x+1
        output marks
        input marks
endwhile
print
```

89, 76, 74, 75, 98, 30 යන සංඛ්‍යා පිළිවෙලින් ඇතුලත්වන්නේ නම් මෙම ව්‍යාජ කේතයේ ප්‍රතිදානය විය හැක්කේ කුමක්ද?

(1). 89 76 74
(3). 89 76 74 75
(2). 89 76 74 75 98
(4). 89 76

30. පහත ආරාවේ තිබෙන ආකාරයට අගයන් ඇතුලත් කිරීම සඳහා භාවිත කළ හැකි නිවැරදි ව්‍යාජකේතය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 10 | 11 | 12 | 23 |

(1).
```
Start
  For x=0 to 3 do
      num[x]=x + 10
  num[3]=num[2]+num[1]
  next x
  stop
```

(2).
```
Start
  For x=0 to 3 do
      num[x]=x + 10
  next x
  num[2]+num[1]= num[3]
 stop
```

(3).
```
Start
  For x=0 to 4 do
      num[x]=x + 10
  next x
  num[3]=num[2]+num[1]
 stop
```

(4).
```
Start
  For x=0 to 3 do
      num[x]=x + 10
  next x
  num[3]=num[2]+num[1]
 stop
```

31. පහතින් දැක්වෙන්නේ අන්තර්ජාලය සම්බන්ධ යෙදුම් කිහිපයක් සහ ඒවාට අදාල විස්තර කිරීම් වේ. නිවැරදි සංයෝග ඇතුලත් වරණය තෝරන්න.

| a | | b | |
|---|---|---|---|
| A | IP ලිපිනය | 1 | බහුමාධ්‍ය, ග්‍රාෆික, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්ධාර ආදිය ඇතුලත්ව සියලුම වර්ගයේ තොරතුරු හුවමාරු කර ගැනීමට උපකාරී වේ. |
| B | SMTP | 2 | ජාලයක ඇති උපාංගයක් අනන්‍ය ලෙස හඳුනා ගැනීමට උපකාරී වේ. |
| C | බහුමාධ්‍ය සැපයුම | 3 | සරල විද්‍යුත් තැපැල් හුවමාරුවේදී භාවිතවන නියමාවලියකි. |

(1). A – 1 , B – 2, C - 3
(3). A – 2 , B – 1, C - 3
(2). A – 2 , B – 3, C - 1
(4). A – 3 , B – 1, C - 2

32. පහත වරණ අතුරින් ආදායම් රහිත සංවිධානයක ඒකාකාර සම්පත් නිශ්චායකයක් හා නිවැරදි ඉ-තැපැල් ලිපියනයක් සහිත වරණය තෝරන්න.

(1). www.educationsl.org සහ sanurasl.gmail@com
(2). www.educationsl.org සහ sanurasl@gmail.com
(3). www.educationsl.gov.lk සහ sanurasl@gmail.com
(4). www.educationsl.ngo සහ sanura sl@gmail.co

33. පහතින් දැක්වෙන්නේ මෘදුකාංග පද්ධති 2ක් සඳහා වන අවශ්‍යතා පිළිබඳ සාරාංශයකි.

A – පද්ධතියේ එක් කුඩා කොටසක් මුලින් සැකසීම අවශ්‍ය අතර ඉන් පසු පිළිවෙළින් ඉතිරි කොටස් එක් කරමින් සෑදිය හැක.

B – පද්ධතියේ අවශ්‍යතා පැහැදිළිව විස්තර කල හැකිවන අතර අතර මැදදී පරිශීලක මැදිහත්වීම අවශ්‍ය නොවේ.

ඉහත ව්‍යාපෘති 2 සඳහා වඩාත් සුදුසු පද්ධති සංවර්ධන ආකෘති දැක්වෙන වරණය වන්නේ,

(1). පුනර්කරණ වෘද්ධි ආකෘතිය හා දියඇළි ආකෘතිය
(2). ව්‍යාපෘති 2 සඳහාම දියඇළි ආකෘතිය
(3). ව්‍යාපෘති 2 සඳහාම පුනර්කරණ වෘද්ධි ආකෘතිය
(4). මූලාදර්ශ ආකෘතිය හා දියඇළි ආකෘතිය

34. පහත දැක්වෙන්නේ ග්‍රාෆිකයක ලක්ෂණ කිහිපයකි.

A - ග්‍රාෆිකයේ පරිමාව වෙනස් කිරීමේදී ගුණාත්මක බව වෙනස් නොවේ.
B - ග්‍රාෆිකයක් නිර්මාණය කිරීමේදී පරිගණකයේ වේගය අඩු වේ.
C - වර්ණ විවිධත්වයකින් යුතු පික්සෙල් ආරාවකින් ග්‍රාෆිකය සමන්විත වේ.
D - සාපේක්ෂව වැඩි පරිගණක මතක ධාරිතාවක් අවශ්‍ය වේ.

ඉහත ලක්ෂණවලින් කුමක්/කුමන ලක්ෂණ වෙක්ටර් ග්‍රාෆික යටතේ විස්තර කෙරෙයිද?

(1). A හා B පමණි
(2). C හා D පමණි
(3). A, B හා C පමණි
(4). A, B හා D පමණි

35. පහත දැක්වෙන ඒවායින් කුමක් ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් තුළ අඩංගු නොවේද ?

(1). ශ්‍රව්‍ය ගොනුවක ආකෘති වෙනස් කිරීම.
(2). ශ්‍රව්‍ය පටිගත කිරීමේදී එහි වේගය වෙනස් කිරීම
(3). රාමු 2ක් අතරතුර සුමට චලනයක් සිදුකර ගැනීම
(4). පරගණකයේ ක්‍රියාත්මකවන සංගීත පටිගත කිරීම

36. පහත පින්තූරයට අනුව එහි එක් පික්සෙලයක් මගින් වර්ණ කීයක් උපරිම වශයෙන් පෙන්විය හැකිද?


(1). 24 colours
(2). $2^{24}$ colours
(3). 72 colours
(4). $2^{72}$ colours

24bpp  72dpi

37. වෙබ් අඩවියක් සඳහා අන්තර්ගත තෝරා ගැනීමේදී ඒ සතු විය යුතු ගුණාංග සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1). ග්‍රාහකයන් ඉක්මණින් ආකර්ශණය කර ගැනීමට හැකි වීම
(2). පරිශීලනය සඳහා පාලන උපක්‍රම යොදා තිබීම
(3). යාවත්කාලීන කිරීමේ ගැටළු අවම වීම
(4). නව අංග එක් කිරීමට ඉඩ ප්‍රස්ථා අවම නොවීම

38. පහත දැක්වෙන HTML ප්‍රතිදානය සඳහා නිවැරදි කේත කණ්ඩය වන්නේ,



```
<body>
  <h2><center>Details of customers</h2></center>
  <table border="1px">
      <caption>Contact numbers</caption>
      <tr>
          <th>Name</th>
           <th colspan="2">Telephone</th>
      </tr>
      <tr>
          <td>Bill Gates</td>
          <td>55577854</td>
          <td>55577855</td>
      </tr>
   </table>
</body>
```

```
<body>
  <h2><center>Details of customers</h2></center>
  <table border="1px">
      <caption>Contact numbers</caption>
      <tr>
          <th>Name</th>
           <th >Telephone</th>
      </tr>
      <tr>
          <td>Bill Gates</td>
          <td>55577854</td>
          <td>55577855</td>
      </tr>
   </table>
</body>
```

```
<body>
  <h2><center>Details of customers</h2></center>
  <table >
      <caption>Contact numbers</caption>
      <tr>
          <th>Name</th>
           <th colspan="2">Telephone</th>
      </tr>
   <tr>
          <td>Bill Gates</td>
          <td>55577854</td>
          <td>55577855</td>
   </tr>
   </table>
</body>
```

```
<body>
  <h2><center>Details of customers</h2></center>
  <caption>Contact numbers</caption>
  <table border="1px">

      <tr>
          <th>Name</th>
           <th colspan="2">Telephone</th>
      </tr>
      <tr>
          <td>Bill Gates</td>
          <td>55577854</td>
          <td>55577855</td>
      </tr>
   </table>
</body>
```

39. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඇසුරෙන් සඳහන් කර ඇති පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1). බුද්ධිමය දේපළවල නෛතික ආරක්ෂාව සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම මගින් සිදුකළ හැකිය.
(2). තොරතුරු ලබාගත් මූලාශ්‍රයන්ගේ වෙබ් ලිපිනයන් සඳහන් කිරීම උපුටා දැක්වීම ලෙස හැඳින්විය හැකිය.
(3). ප්‍රති-වෛරස් මෘදුකාංග මගින් පද්ධතියකට ඇතුලත්වන අනවසර ප්‍රවේශකයින් සම්පූර්ණයෙන්ම නවතා දැමිය හැකිය.
(4). ආයාචිත තැපැල අව්‍යාජ බවක් පෙන්නුම් කරමින් පරිශීලකයා නොදැනුවත්වම පද්ධතියට ඇතුලත් වෙයි.

40. පරිගණක පද්ධතියක තාර්කික ආරක්ෂාව සඳහා භාවිත කළ හැකි වඩාත් සුදුසු විසඳුමක් වන්නේ,

(1). දෘඩාංග ගිනිපවුරු
(2). සර්ජන ආරක්ෂක
(3). අනුපිටපත්
(4). සංවෘත පරිපථ රූපවාහිනී

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ඉ-ඉගෙනුම් හා නැණස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**
**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2018**

**80 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II**

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ 2 |
|---|---|---|

- *පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.*
- *පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10ක් හිමි වේ.*

01.

(1). තොරතුරු යනු ආයතනයක තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඉතා වැදගත් දෙයකි. විශේෂයෙන්ම තම ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කරන ව්‍යාපාරයකට ඉතාමත් වැදගත් වේ. මෙම ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා තීරණ ගනිමින් සිටී.

i)ඉහත අවස්ථාව සඳහා අවශ්‍යවන තොරතුරුවල තිබිය යුතු ගුණාංග 2ක් දක්වන්න.

ii)ඉහත අවස්ථාවේදී මෙම ආයතනයේ අභ්‍යන්තර තොරතුරු සඳහා උනන්දුවක් දක්වන පාර්ශව 2ක් නම් කරන්න.

(2).

a. $1000\ 0101\ 0011_{bcd}$ ට සමාන ද්විමය අගය ලියා දක්වන්න.

b.ඔබගේ පිළිතුරට සමාන ෂඩ් දශමක අගය ලියන්න.(ගණනය කිරීම පෙන්වන්න)

(3). මාර්ග තදබදය වලක්වාලීමට ක්‍රියාත්මක කරන පද්ධතියක බූලියානු තාර්කික ද්වාර භාවිතයෙන් පාලනය කිරීම සිදුකරයි. මෙහි ආදාන X සහ Y ලෙසද ප්‍රතිදානය C වන අතර එහි අගය 1 වේ.


මෙම පද්ධතියේ - X ආදානය රතු පැහැ වූවිට හෝ

X ආදානය කොළ පැහැ වී සහ Y ආදානය රතු වර්ණයෙන් ගත්විට

පද්ධතිය ක්‍රියාත්මක වේ.

(NOTE: මෙහි රතු වර්ණය 0 න්ද, කොළ වර්ණයෙන් ද ඇතිවන සලකන්න.

පහත දී ඇති පරිපථය සම්පූර්ණ කරන්න.



(4). පහතින් දැක්වෙන්නේ ආයතනයක වැඩ පරිසරය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් කිහිපයකි.

| | |
|---|---|
| A | ගිනිපවුර |
| B | පරිශීලක නාම හා මුරපද |
| C | UPS |
| D | ප්‍රති-වෛරස් මෘදුකාංග |
| E | ගුප්ත කේතනය |
| F | පරිගණක පරිශීලකයන් භාවිත කරන පරිගණක නිවැරදි ඉරියව්වන්ගෙන් භාවිතයට අවශ්‍ය පරිසරය සලසා දීම |

පහත දැක්වෙන ගැටළු සඳහා සුදුසු භාවිත කළ හැකි විසඳුම/විසඳුම් ඉහත වගුවෙන් තෝරා ලියන්න *(Note – එක් ගැටළුවකට සුදුසු විසඳුම් එකකට වැඩිවිය හැක.)*

| | **ගැටළුව** | **විසඳුම/විසඳුම්** |
|---|---|---|
| 1 - | පරිගණක පද්ධතියට අනවසරයෙන් ඇතුළු වී දත්ත සොරා ගැනීම/විනාශ කිරීම | ................... |
| 2 - | පරිගණක සඳහා ඉහළ විදුලි ධාරාවක් ලැබීම | ................... |
| 3 - | පෞද්ගලික ලිපිගොනු පිටපත් කිරීම හෝ වෙනස් කිරීම | ................... |
| 4 - | මාංශපේෂී හා අස්ථි ආශ්‍රිත ගැටළු | ................... |


(5). කෞෂල්‍යා මුදල් තැන්පත් කිරීමට සුහුරු පද්ධතියක් භාවිත කරයි. ඇය ගිණුම් අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත්කරන අතර ඉන් පසු දුරකථන අංකය ඇතුලත් කරයි. අනතුරුව මුදල් ඇතුලත් කිරීමෙන් පසුව යන්ත්‍රය විසින් මුදල්වල වලංගුතාවය පරීක්ෂා කර ඇතුලත්කරන ලද මුදල් ප්‍රමාණය පෙන්වයි. මෙම ක්‍රියාවලිය අවසන්වූ විට පරිශීලකයාගෙන් අවසාන එකඟතාවය ("OK") ලබා ගනී. ඉන් පසුව අදාල තොරතුරු තිරය මත පෙන්වා රිසිට්පත ලබා දෙයි.
ඉහත විස්තරයට අනුව ආදාන 2, සැකසුම් ක්‍රියාවලි 2, ප්‍රතිදාන 2 ලියා දක්වන්න,

(6). පහත ව්‍යාජකේතයේ ප්‍රතිදානය කුමක්ද?

```
x=1
while x<=2 do
        for y=1 to 10 step 3 do
                print (x * 2)
        end while
        x=x+1
end while
```

(7). ග්‍රාෆික සංස්කරණ ක්‍රියාවලියේදී පහත මෙවලම්වල කාර්යය කුමක්ද?.


a. 

b. 

c. 

d. 

(8). පහතින් දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංගකින් සකසන ලද වදන් කොටසකි. දී ඇති මෙවලම් අතරින් අදාල සැකසීම් සඳහා භාවිත කර ඇති මෙවලම් නිවැරදි අංකය ඉදිරියෙන් ලියන්න.




(9). වර්තමානයේ බොහෝමයක් පරිශීලකයින් ඔවුන්ගේ දත්ත ගබඩා කිරීම් අවශ්‍යතා සඳහා දෘඩ තැටිවලට වඩා ඝන තත්ත්වයේ ආචයන උපාංග භාවිත කරයි.

a. ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද?

b. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(10). පහත දැක්වෙන ප්‍රකාශවල සත්‍ය අසත්‍යතාවය දක්වන්න.

a. අනවශ්‍ය ශබ්ද අවම කිරීමෙන් / ඉවත් කිරීමෙන් ශ්‍රව්‍ය සංධාරයක ධාරිතාව/තත්ත්වය වැඩිකර ගත හැක. (    )

b. හොඳින් සැලසුම් කරන ලද වෙබ් අඩවියක් පරිශීලකයාට පහසුවෙන් වෙබ් අඩවිය තුළ සැරිසරීමට උපකාරී වෙයි. (    )

c. පික්සෙල කුඩා ප්‍රමාණයකින් යුක්ත ග්‍රාෆිකයක් විශාල කර බැලීමේදී එහි තත්ත්වය අඩු වේ. (    )

d. විද්‍යුත් තැපෑලක Bcc පිටපතක් ලද පුද්ගලයෙකුට එම විද්‍යුත් තැපෑල ලද අනෙක් ලබන්නන් සියල්ලගේම ලිපින දැකගත හැකි අතර Cc පිටපතක් ලද පුද්ගලයෙකුට එම විද්‍යුත් තැපෑලම Bcc පිටපත ලද අනෙක් ලබන්නන් දැකිය නොහැක. (    )


02. පහතින් දැක්වෙන පැතුරුම්පත අධ්‍යාපන ආයතනයක පාඨමාලාවල සිසුන්ගේ ලකුණු ගබඩා කිරීමට භාවිත කරන්නකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**Students' Records - Group A**

| | A | B | C | D | E | F | G | H | I | J | K |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | st no | st name | Semester 1 | | | Sem 1 Average score | Semester 2 | | | Sem 2 Average score | Hieghest average |
| 3 | | | Sub 1 | Sub 2 | Sub 3 | | Sub 1 | Sub 2 | Sub 3 | | |
| 4 | st00134 | S. senaya | 45 | 56 | 46 | 61.00 | 56 | 48 | 57 | 53.67 | 52.89 |
| 5 | st00135 | R. Thisak | 56 | 54 | 69 | 71.67 | 67 | 58 | 63 | 62.67 | 61.22 |
| 6 | st00136 | S. Amika | 67 | 67 | 65 | 78.33 | 68 | 70 | 65 | 67.67 | 67.56 |
| 7 | st00137 | T. Lehansa | 65 | 71 | 56 | 76.00 | 68 | 54 | 67 | 63.00 | 61.33 |
| 8 | st00138 | U. Chenuli | 34 | 68 | 58 | 65.33 | 50 | 58 | 45 | 51.00 | 51.33 |

**Students' Practical Mark for group A**

| | B | C |
|---|---|---|
| 11 | Semester 1 | 12 |
| 12 | Semester 2 | 16 |




(1). සිසුවකු එක් වාරයකදී (වාරය 1) විෂයන් 3ට ලබාගත් සාමාන්‍ය ලකුණට එම වාරය සඳහා එම කණ්ඩායම ලබාගත් ප්‍රායෝගික ලකුණු(C11) එකතු කර ගණනය කරයි. S. සෙනායා ශිෂ්‍යාව පළමු වාරය සඳහා ලබා ගත් සාමාන්‍ය ලකුණු F4 කෝෂය තුළ ගණනය කිරීම සඳහා අවශ්‍ය සූත්‍රය ලියන්න. මෙම සූත්‍රය පිටපත් කිරීම මගින් අනෙක් සිසුන්ගේ ලකුණු ගණනය කරනු ලැබේ.

(2). ඉහත ගණනය කිරීම්වලින් අනතුරුව F4 කෝෂය තුළ දක්නට ලැබෙන සූත්‍රය කුමක්ද?

(3). වාර දෙකෙහිම S. සෙනායා සිසුවිය ලබාගත් වැඩිම සාමාන්‍ය ගණනය කිරීම සඳහා K4 කෝෂය තුළ ඇතුලත් කලයුතු ශ්‍රිතය සඳහන් කරන්න. මෙම සූත්‍රය අනෙක් සිසුවියන්ගේ සාමාන්‍ය ගණනය කිරීම සඳහා ද පිටපත්වන බව සලකන්න.

st00134 යන සිසුවියගේ සාමාන්‍ය සෙවීමේදී K4 කෝෂය තුළ ඇතුලත්වන ශ්‍රිතය =function(cell1,cell2,cell3) නම් function, cell1, cell2, cell3 සඳහා ලිවිය යුතු අගයන් සඳහන් කරන්න.

(4). මෙම පැතුරුම්පතෙහි සිසුන්ගේ දක්ෂතා බැලීම සඳහා ප්‍රස්තාර භාවිත කරයි.

a. ඉහත කාරණය සම්බන්ධයෙන් වඩාත් සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්ද?

b. ඔවුන් මේ සඳහා වට ප්‍රස්තාර නොකරන්නේනම් ඊට හේතුවිය හැක්කේ කුමක්ද?

(5). ඉහත ගණනය කිරීම් සඳහා පැතුරුම්පත් මෘදුකාංගයකින් ඔබට ලැබෙන විශේෂ පහසුකම් මොනවාද?

03. පහතින් දැක්වෙන්නේ මූල්‍ය ආයතනයක භාවිත කරන දත්ත පාදකයකි. මෙහි එම ආයතනයේ ගිණුම් හා ගිණුම් හිමියන් ආදිය පිළිබඳ සටහන් කරයි. දත්ත පාදකය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**Account**

| Account | acc_type | no_of_acc |
|---|---|---|
| 16plus | Single | 23090 |
| Kids | Single | 23909 |
| Ladies | Single | 13000 |
| couple | Joint | 2579 |
| Adult+ | Single | 32402 |

**Acc_customer**

| Acc_no | Cus_id | Account | Balance |
|---|---|---|---|
| 1008 456 22 | 823883834v | 16plus | 45,000.00 |
| 1003 300 45 | 930034533v | Joint | 120,000.00 |
| 1002 390 32 | 823883834v | Ladies | 540.00 |
| 1002 456 23 | 838483222v | Ladies | 1,000.00 |
| 1008 657 68 | 945655849v | 16plus | 13,402.00 |
| 1003 868 00 | 737575849v | Joint | 235,643.00 |

**Custmer**

| cus_id | cus_name | Address |
|---|---|---|
| 823883834v | M. Perera | Colombo |
| 838483222v | L.Sunethra | Kandy |
| 930034533v | G. Ravindra | Maharagama |
| 737575849v | R.Kavin | Matara |
| 945655849v | R.Kavin | Matara |

1) "මෙම දත්ත පාදකය තුළ සියලු දත්ත එක් වගුවක ගබඩා කිරීම වෙනුවට වෙන් වෙන් වශයෙන් වගුවල ගබඩා කරයි. මේ මගින් ඔවුන් දත්ත අනුපිටපත්වීම වැලැක්වීම අපේක්ෂා කරයි."
   A. ඉහත සඳහන් ගැටළුවට අමතරව තනි වගුවක සියල්ල ගබඩා කිරීම නිසා මතුවිය හැකි ගැටළු 3ක් සඳහන් කරන්න.
   B. මෙම ආයතනය භාවිත කර ඇති දත්ත පාදක වර්ගය කුමක්ද?
2) පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා සුදුසු දත්ත ප්‍රරූප මොනවාද?
   (1) Acc_type (3) Balance
   (2) Cus_id (4) No_of_acc
3) account සහ customer වගු දෙක අතර පවතින සම්බන්ධතාවය කුමක්ද?
4) L. සුනේත්‍රා (38483222v) රු 1,000/= ක් ඇයගේ කාන්තා(ladies) ගිණුමෙන් ගන්නා අතර ඇය එම ගිණුම වසා දැමීමට තීරණය කරයි.
   A. ඉහත ගනුදෙනුව නිසා වෙනස් වන වගු මොනවාද?
   B. අදාල රෙකෝඩ පෙන්වන්න.
5) කාන්තා(ladies) ගිණුමේ රු 50000ට වඩා වැඩි තැනපතුවක් පවත්වාගෙන යන ගිණුම් පිළිබඳ විස්තරයක් කළමනාකරුට අවශ්‍යව ඇත. මෙම ලැයිස්තුව විද්‍යුත් තැපැලක් සමග අමුණා ප්‍රාදේශීය කාර්යාලය වෙත යැවීමට ඔහු අපේක්ෂා කරයි. මෙම අවශ්‍යතා සඳහා දත්ත පාදක කළමනාකරණ මෘදුකාංගයක ලබා දී ඇති පහසුකම් ඔහු භාවිත කරයි.
   ඉහත කාර්යන් ඉටුකරගැනීමට දත්ත පාදක කළමනාකරණ පද්ධතියක ඔහුට භාවිත කල හැකි මූලිකාංගය කුමක්ද?

04. "Sri Lankan Farmers" යනු ජාතික වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුවල යෙදෙන ආයතනයකි. අවුරුදු 5කට පෙර ඔවුන් ස්ථාපිත පරිගණකගත පද්ධතියක් මේ වන විටත් භාවිත කරන අතර ඔවුන් එමගින් බොහෝ ප්‍රතිලාභ ලබාගෙන ඇත.
නමුත් ඊළඟ වසරේ සිට සියළුම ව්‍යාපාර කටයුතු මාර්ගගතව සිදු කිරීමට අපේක්ෂා කරන අතර පවතින පද්ධතියෙන් සිදුකරන සියලුම කටයුතු මෙම වෙබ් පාදක පද්ධතිය මගින් සිදු කිරීමට අපේක්ෂා කරයි.
   a. පවතින පද්ධතිය නව පද්ධතියකට වෙනස් කිරීමට මෙම ආයතනය තීරණය කිරීමට හේතුවිය හැකි කරුණු 2ක් ලියන්න.
   b. පහත පාර්ශවයන් සඳහා මෙම මාර්ගගත පද්ධතිය මගින් සැලසෙන ප්‍රතිලාභ 2 බැගින් ලියන්න.
      1. පාරිභෝගිකයා 2. වෙළඳ ආයතනය

c. යෝජිත පද්ධතිය ගොඩනැගීම සඳහා සර්පිලාකාර ආකෘතිය භාවිත කිරීමට අපේක්ෂා කරයි.
   1. ඉහත තීරණය සම්බන්ධයෙන් ඔබ එකඟ වන්නේද?
   2. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

d. "Sri Lankan Farmers" ආයතනයේ කාර්ය මණ්ඩලය මෙම වගාකටයුතුවල ඵලදායීතාවය වැඩිකිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ තාක්ෂණයන් හා මෙවලම් භාවිත කිරීමට අපේක්ෂා කරයි.
   1. ඉහත අවශ්‍යතාවය සඳහා භාවිත කල හැකි තාක්ෂණයන් 3ක් සඳහන් කරන්න.
   2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ තාක්ෂණයන් හා මෙවලම් භාවිත කිරීමේදී ඔවුන් මුහුණ පාන ගැටළු 2ක් සඳහන් කරන්න.

05.

(1). පහතින් වරහන් තුළ දී ඇති වදන් භාවිත කරමින් හිස්තැන් පුරවන්න.

a. Notepad වැනි ………………… භාවිත කරනු වෙනුවට Coffeecup, Seamonkey composer ආදී HTML සංස්කරණ භාවිතය මගින් වඩාත් පහසුවෙන් HTML කේත ලිවිය හැක.

b. දෙන ලද පින්තූරයක් වෙබ් අඩවියේ පෙන්නුම් නොකරන අවස්ථාවක ………………… මගින් පින්තූරයේ අන්තර්ගතය පිළිබඳ තේරුම් ගත හැකිය.

c. ………………….මගින් වගුවක කෝෂ මායිම් 2ක් අතර පරතරය පෙන්විය හැක.

d. වෙබ් පිටුවක අන්තර්ගතය නිරන්තරයෙන් වෙනස් වන ලෙස සකසා ඇත්නම් එම වෙබ් පිටු ………. ලෙස හඳුන්වයි.

(dynamic, text editor , alternate text, Html editors, cellpadding , cell spacing, static)

(2). පහත වෙබ් පිටුව සඳහා වන HTML හිස්තැන් සහිතව පහතින් දක්වා ඇත. දී ඇති පිළිතුරු ඇසුරෙන් හිස්තැන්වලට සුදුසු යෙදුම් ලියා දක්වන්න.





**Title**
**border**
**center**
**H5**
**H3**
**Colspan**
**OL**
**UL**
**row span**
**caption**
**src**
**target**

```
<html>
        <head>
                <(1) >Sales</ (1) >
        </head>
        <body>
                <h1><center>Hurry up!!!</h1></center>
                <hr>
                < (2) ><img src="images/sales.jpg" border="1px"></ (2) >
                <(9)  (3)  ="1px">
                        < (4)  ><(5)>Special offers</ (5) ></ (4)  >
                        <tr>
                                <th>Type Item</th>
                                <th (6)  ="2px">Discount</th>
                        </tr>
                        <tr>
                                <td><font size="4px">
                                        < (7)  >
                                                <li>Kids' wear</li>
                                                <li>school uniform</li>
                                        </ (7)  >
                                </font></td>
                                <td><font size="4px">70%</font></td>
                                <td><img (8)  ="images/discount1.jpg" ></td>
                        </tr>
                        <tr>
                                <td><font size="4px">curtains</font></td>
                                <td><font size="4px">60%</font></td>
                                <td><img src="images/discount2.jpg" ></td>
                        </tr>
                </ (9)>
                <center>
                        <a href="www.fashions.com" (10) ="_blank">click here to visit our web site
                </center>
        </body>
</html>
```

06.

(1). සිසුන් 1500ක් සිටින විශ්ව විද්‍යාලයක එම ළමුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට සිසුන්ගේ සුදුසුකම් පරීක්ෂාව වැඩපිළිවෙල සඳහා පහත ගැලීම් සටහන භාවිත කරයි. මෙහිදී සිසුන්ගේ ලකුණු හා තම පවුලේ වාර්ෂික ආදායම සැලකිල්ලට ගනී. ලකුණු 90ට වඩා ගන්නා සිසුන්ට පවුලේ ආදායම නොසලකා “ශිෂ්‍යත්ව 1” පිරිනමයි. අනෙක් සිසුන්ට ලබා දීමේදී පවුලේ වාර්ෂික ආදායම පහත අයුරින් සලකා බලයි.

වාර්ෂික ආදායම රු 300000 ට අඩුනම් “ශිෂ්‍යත්ව 1” ද රු 300000ට වැඩි නමුත් රු500000 ට අඩු සිසුන්ට “ශිෂ්‍යත්ව 2” ද පිරිනමන අතර අනෙක් සිසුන්ට “සුදුසුකම් නොවේ ” ලෙසද පෙන්විය යුතුය. දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි පිළිතුරු තෝරා ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.




1. Is Student<=1500 ?
2. Is Mark>=90 AND Income<=300000 ?
3. scholarship_type2= scholarship_type2+1
4. Is Income<=500000 ?
5. Student=student+1
6. scholarship_type1= scholarship_type1+1
7. Scholarship=“Not eligible”

(2). පහතින් දැක්වෙන්නේ අධ්‍යාපන ආයතනයක සිසුන්ගේ නම සහ ලකුණු භාවිතයෙන් ඔවුන්ගේ පන්ති පැවැත්වෙන දිනය තීරණය කිරීම සඳහා ලබා දී ඇති ව්‍යාජකේතයකි.

එහි ලබා දී ඇති අගයයන්ට අනුව ප්‍රතිදානය ලියන්න.

```
List_name=[“Shaan”,”Oneli”,”Ruwen”,”Romesh”,”Kushan”]
List_Mark =[75,45, 76, 59, 36]
for i = 0 to 4 step 1 do
        if (List_Mark [i]>=50)then
                date=”Monday”
        else
                date=”Wednesday”
        endif
        Print(List_name[i])
        Print(List_mark[i])
endfor
```

07.

(1). කසුන් සේවය කරන "World Techno" ආයතනය නුවර පිහිටා ඇති අතර ඔහු ආයතනයට නොගොසින් නිවසේ සිට තම උකුල් පරිගණකය හා අන්තර්ජාලය භාවිතයෙන් තම සේවය සපයයි. මසකට වරක් මෙසේ සේවය කරන සියලු දෙනා ප්‍රගතිය පිළිබඳ රැස්වීමක් පැවැත්විය යුතුය. මෙම රැස්වීමේදී ඔවුන් තම කාර්යයන් සියල්ල හුවමාරු කර ගනී

a. ඉහත කසුන්ගේ රැකියාව පිළිබඳ පහත සිද්ධීන් හඳුන්වන නම කුමක්ද?
   1. කසුන් රැකියා ස්ථානයට නොගොසින් තම පරිගණකය හා අන්තර්ජාලය හරහා සේවය සැලසීම
   2. මසකට වරක් තමන් සිටිනා ස්ථානයේ සිට රැස්වීම් පැවැත්වීම

b. ඉහත සඳහා වැඩ කිරීමේ රටාව/ ආකාරය නිසා කසුන් ලබා ගන්නා ප්‍රතිලාභ 2ක් ලියන්න.

c. World Techno" ආයතනය ඔවුන්ගේ සේවා කටයුතු මාතර, කොළඹ ආදී ප්‍රදේශවලත් විකාශනය කිරීමට අපේක්ෂා කරයි. තවදුරටත් ඔවුන් ප්‍රධාන කාර්යාලයේ සිට සියලුම ශාඛා පරිගණක ජාලයක් ඔස්සේ මධ්‍යගත කළමනාකරණයක් සිදු කිරීමටත් අපේක්ෂා කරයි.
   1. ඉහත අවශ්‍යතා සපුරාලීමේදී මෙම ආයතනයට වඩාත් සුදුසු පරිගණක ජාල වර්ගය කුමක්ද?
   2. ප්‍රධාන කාර්යාලයේ සිට උක්ත කාරණය සම්බන්ධයෙන් කටයුතු සිදුකරද්දී අවශ්‍යවන උපාංග 2ක් නම් කරන්න.
   3. ඔබ ඉහත c(2) හි ලබා දුන් උපාංග එක් එක්හි භාවිතය බැගින් ලියන්න.

********